කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

## 2022 අප්‍රේල් මස 12 දින සඳහා කාලගුණ අනාවැකිය
## 2022 අප්‍රේල් මස 11 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

**පහළ වායුගෝලයේ කැළඹිලි ස්වභාවය තවදුරටත් දිවයින ආශ්‍රිතව පවතින බැවින් වැසි තත්ත්වය ඉදිරියටත් බලාපොරොත්තුවේ.**

දිවයිනේ බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, වයඹ සහ උතුරු-මැද පළාත්වලත් මන්නාරම, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට **මි.මී. 100** වැඩි තද වැසි ඇතිවිය හැක.

සෙසු ප්‍රදේශවල ද ඇතැම් ස්ථාන වලට **මි.මී. 75 වැඩි** තරමක තද වැසි ද ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

දෘශ්‍ය ලෙස සූර්යයා උතුරට ගමන් කිරීමේදී සූර්යයා, අප්‍රේල් මස 05 සිට 15 දක්වා දිනවලදී ශ්‍රී ලංකාව ආශ්‍රිත අක්ෂාංශ වලට සෘජුවම ඉහලින් පවතී. හෙට දින (12) දහවල් 12:11 ට පෙරියමුරිප්පු , රළපනාව , වාගොල්ලකඩ සහ නිලාවෙලි යන ප්‍රදේශ වලට හිරු මුදුන් වනු ඇත.

## WEATHER FORECAST FOR 12 APRIL 2022
## Issued at 12.00 noon on 11 APRIL 2022

**The low-level atmospheric disturbance still persists in the vicinity of Sri Lanka. Hence prevailing showery condition is expected to continue.**

Showers or thundershowers will occur over most parts of the island.

Heavy showers **above 100 mm** can be expected at some places in Western, Sabaragamuwa, Central, North-western and North-central provinces and in Mannar, Galle and Matara districts.
Fairly heavy showers **above 75 mm** can be expected at some places elsewhere.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

On the apparent northward relative motion of the sun, it is going to be directly over the latitudes of Sri Lanka from 05$^{th}$ to 15$^{th}$ of April in this year. The nearest areas of Sri Lanka over which the sun is overhead tomorrow (12$^{th}$) are Periyamurippu, Ralapanawa, Wagollakada and Nilaveli at about 12:11 noon.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2022 අප්‍රේල් මස 11 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**දිවයින ආශ්‍රිතව පහළ වායුගෝලයේ පවතින කැළඹිලි ස්වභාවය හේතුවෙන් ගාල්ල සිට මාතර හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (40-50) දක්වා වැඩිවිය හැකි බැවින් ධීවර සහ නාවික ප්‍රජාව මේ සම්බන්ධයෙන් විමසිලිමත් වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. කන්කසන්තුරය සිට මන්නාරම, පුත්තලම, ගාල්ල සහ මාතර හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තද වැසි ද ඇතිවිය හැක.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (20-30) පමණ වේ. ගාල්ල සිට මාතර හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (40-50)** දක්වා වැඩිවිය හැක.

**මුහුදේ ස්වභාවය:**

පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ මාතර හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. සෙසු මුහුදු ප්‍රදේශ තරමක් රළු වේ.
**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 12.00 noon on 11 April 2022**

**Wind speed can increase up to (40-50) kmph at times in the sea areas off the coast extending from Galle to Hambantota via Matara due to the low-level atmospheric disturbance in the vicinity of Sri Lanka. The fishing and naval communities are advised to be vigilant in this regard.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas around the island. Heavy showers can be expected at some places in the sea areas off the coast extending from Kankasanturai to Hambantota via Mannar, Puttalam, Galle and Matara.

**Winds:**

Winds will be south-westerly or variable in direction and wind speed will be (20-30) kmph. Winds speed can increase up to **(40-50) kmph** at times in the sea areas off the coast extending from Galle to Hambantota via Matara.

**State of Sea:**

The sea areas off the coast extending from Puttalam to Hambantota, via Colombo, Galle and Matara will be rough at times. The other sea areas around the island will be fairly rough.
**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි